මගේ අංකය: SLLA/Edu/2020/01

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මගින් මෙහෙයවනු ලබන **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව** (Diploma in Library and Information Science - DIPLIS), 2020 පෙබරවාරි මස 15 දින සිට **'පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමාව'** - Higher Diploma in Library and Information Science –HDIPLIS) ලෙස නම් කිරීමට 2020 ජනවාරි 25 වැනි දා රැස් වූ පාලක මණ්ඩල රැස්වීමේ දී තීරණය කරන ලද බව මෙයින් දන්වා සිටිමු.

ඒ සමගම එම පාඨමාලාවේ එක් එක් අදියර 2015 වසරේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පළ කරන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ (Sri Lanka Qualifications Framework - SLQF) අදාළ ස්ථර සමග ගැලපීමට ද කටයුතු කර ඇත. මීට අමතරව ජාතික වෘත්තීය යෝග්‍යතා රාමුවේ (National Vocational Qualifications Framework - NVQ) අදාළ ස්ථරය ද ඉහත ලේඛනයට අදාළව දක්වා ඇත.
(www.ugc.ac.lk/attachments/1156_SLQF_2016_en.pdf, පි.11 බලන්න).

උපයා ගන්නා යෝග්‍යතා සහ ඒවාට අදාළ SLQF සහ NVQ ස්ථර පහත දැක්වේ.

| **අදියර** | **අදියර අවසන උපයා ගන්නා යෝග්‍යතාව (Qualification)** | **යෝග්‍යතාව හඳුන්වන සංක්ෂේපය (Abbreviation)** | **ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ (SLQF) අදාළ ස්ථරය** | **සමාන NVQ ස්ථරය*** |
|---|---|---|---|---|
| පළමු අදියර (Level I) | පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමාව | Dip (Lib Sc) | SLQF 03 | NVQ 05 |
| දෙවන අදියර (Level II)* | - | - | - | - |
| තෙවන අදියර (Level III) | පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමාව | HDip (Lib Sc) | SLQF 04 | NVQ 06 |

*** උසස් ඩිප්ලෝමාව සඳහා දෙවන හා තෙවන අදියර එකතුව දායක වන බව සලකන්න.**

**සභාපතිනි**
**ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

2020.02.21

Sri Lanaka Library Association
275/75, Prof. Stanley Wijesundara Mw
Colombo 07,
Sri Lanka.

☎ 94 11 2589103
94 11 2589103
slla@sltnet.lk
http://www.slla.org.lk

**President:** Dr. (Ms) Nayana Wijesundara
**Gen. Secretary:** Ms. Lilamani Amarasekara
**Treasurer:** Ms. Waruni Gangabadaarachchi
**Edu. Officer:** Dr. (Ms) Champa Alahakoon

උද්ධෘතය: ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය - 2016 පෙබරවාරි යාවත්කාලීන සංස්කරණය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව. පි.17.

## ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ විවිධ ස්තර, උසස් අධ්‍යාපන යෝග්‍යතා ප්‍රභේද හා අනුරූප ජාතික වෘත්තීය යෝග්‍යතා මාර්ගෝපදේශ ස්තර

අනුරූප NVQ හා SLQF ස්තර හඳුනාගනු ලැබ ඇත්තේ විශේෂඥ මඬුල්ලක් විසින් සකස් කරන ලද මාර්ගෝපදේශ ද්වයයෙහි ස්තර සූචක (level descriptors) යටතේ දක්වනු ලැබ ඇති ඉගැනුම් ඵල අතර ඇති සුවිශේෂ සමානතා පදනම් කරගනිමිනි. ප්‍රථම උපාධිය සඳහා ජාත්‍යන්තර සම්මතය (SLQF පස් වැනි ස්තරය) සඳහා මිනුම් ලකුණක් ලෙසින් උපාධි ස්තර යෝග්‍යතාව (NVQ හත් වැනි ස්තරය) යොදාගැනේ. එසේ නමුත්, ඥානමය ඵල හා බුද්ධිමය ඵල ප්‍රමාණය ඒ යෝග්‍යතා ද්වයයේ දී, විශේෂයෙන් SLQF දෙ වැනි ස්තරයට (NVQ සිවු වැනි ස්තරයට) පහළ ස්තරවල දී අසමාන විය හැකි ය. උපාධි ස්තරයට පහළ යෝග්‍යතාධාරීන් දෙදෙනකුගේ යෝග්‍යතා ලක්ෂණ එකිනෙකට අනුරූප SLQF හා NVQ ස්තරවල දී සමාන නො විය හැකි ය.

| SLQF ස්තරය | ප්‍රදානය කරනු ලබන යෝග්‍යතාව | අනුරූප NVQ ස්තරය |
|---|---|---|
| 12 | දර්ශන විශාරද උපාධිය / වෛද්‍ය සභාවේ අනුමැතිය සමඟ වෛද්‍ය විශාරද උපාධිය /දර්ශනසූරී උපාධිය/ විද්‍යාවිශාරද උපාධිය | |
| 11 | දර්ශනපති උපාධිය | |
| 10 | පර්යේෂණ සංරචකය හා ඉගැන්වීම් පාඨමාලාව සහිත ශාස්ත්‍රපති උපාධිය | |
| 9 | ඉගැන්වීම් පාඨමාලාව සහිත ශාස්ත්‍රපති උපාධිය | |
| 8 | පශ්චාද උපාධි ඩිප්ලෝමාව | |
| 7 | පශ්චාද් උපාධි සහතිකය | |
| 6 | ගෞරව ප්‍රථම උපාධිය | |
| 5 | ප්‍රථම උපාධිය | 7 |
| 4 | උසස් ඩිප්ලෝමාව | 6 |
| 3 | ඩිප්ලෝමාව | 5 |
| 2 | උසස් සහතික පත්‍රය (අ.පො.ස.) උසස් පෙළ හෝ සමාන යෝග්‍යතාවක් | 4 |
| 1 | සහතික පත්‍රය (අ.පො.ස.) සාමාන්‍ය පෙළ හෝ සමාන යෝග්‍යතාවක් | 3<br>2 |

**දෙ වැනි වගුව**